ඇමුණුම - I



2020 ජූලි මස 21 වන දින

අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය)

අතිරේක ලේකම් (මෙහෙයුම්)

ලේකම් (අධ්‍යාපන සේවා කමිටුව)

ලේකම් (සෞඛ්‍ය සේවා කමිටුව)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (උසස්වීම්)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පත්කිරීම්)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විනය)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභියාචනා)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ස්ථාන මාරු/ විවිධ කටයුතු)

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උසස්වීම්/ තනතුරට පත් කිරීම් සම්බන්ධයෙන් නියෝග ලබා දීමෙන් අනතුරුව නිලධාරීන් විසින් එම තීරණ සම්බන්ධයෙන් නැවත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අභියාචනයන් සලකා බැලීම.</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උසස්වීම්/ තනතුරට පත් කිරීම් සම්බන්ධ නියෝග ලබා දීමෙන් අනතුරුව රාජ්‍ය නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විවිධාකාරයෙන් අභියාචනයන් ඉදිරිපත් කරන බව නිරීක්ෂණය විය. උසස්වීම්/ තනතුරට පත් කිරීම් සඳහා නියෝගයක් ලබා දීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් නැවත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අභියාචනයන් සලකා බැලීම සඳහා ප්‍රතිපාදනයන් ද නොමැති හෙයින් එය අනවශ්‍ය කාලය වැය කිරීමක් බවට නිරීක්ෂණය කරන ලද එම කොමිෂන් සභාව, එවැනි අභියාචනයන් සම්බන්ධයෙන් ඉදිරියේ දී පහත පරිදි කටයුතු කිරීමට තීරණය කර ඇත.

I. උසස් කිරීමට/ තනතුරට පත් කිරීමට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද නියෝගය තාක්ෂණික දෝෂයක් සහිත වීම හෝ ඊට අදාළ වන නීතිරීති රෙගුලාසි පිළිබඳව යාවත්කාලීන නොවී නිකුත් කරන ලද නියෝගයක් ලෙස හෝ පෙනී යයි නම් ඒ සඳහා **පළමුවරට** ඉදිරිපත් කරනු ලබන අභියාචනය පමණක් සලකා බැලීමට

II. එම පළමු අභියාචනය ද නියෝග නිකුත් කරන ලද දිනෙන් දින 60 ක් තුළ ඉදිරිපත් කරනු ලබන අභියාචනාවක් වන්නේ නම් පමණක් සලකා බැලීමට.

III. පහත සඳහන් එක් කරුණකට හෝ කරුණු කිහිපයක් යටතට ගැනෙන අභියාචනා අදාළ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ/ නිර්දේශ කැඳවීමකින් තොරව කොමිෂන් සභාවේ අනුමැතිය මත ප්‍රතික්ෂේප කිරීමට

a) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද තීරණයට අදාළව තාක්ෂණික දෝෂයන් නොමැති වීම හේතුවෙන් පළමු අභියාචනය ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ද එම පළමු අභියාචනයෙන් දක්වන ලද කරුණුවලට අතිරේකව වෙනත් කරුණු ද නොමැතිව **නැවත නැවතත් ඉදිරිපත් කරනු ලබන අභියාචනා**

b) පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් **ප්‍රතික්ෂේප** කරන ලද අභියාචනා සම්බන්ධයෙන් නැවත නැවතත් ඉදිරිපත් කරනු ලබන අභියාචනා

c) ඉහත II හි සඳහන් නියමිත කාලය තුළ අභියාචනා නොකිරීම සම්බන්ධයෙන් **පිළිගත හැකි ප්‍රමාණවත් හේතු සහ පැහැදිලි කිරීම් ද නොමැතිව** එම කාලය තුළ ඉදිරිපත් නොකරනු ලබන අභියාචනා

d) යම් උසස්වීමක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගය ලබා දීමට ප්‍රථමයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා (එවැනි අභියාචනා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව අභියාචක වෙත දැනුම් දීමක් සිදු නොකෙරෙනු ඇත)

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඇමුණුම ii

**වෙනත් බලය අභිනියෝජිත බලධරයෙකුට පවරා නොමැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ම සිදු කරනු ලබන උසස්වීම්/ තනතුරට පත් කිරීම් සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීම පිළිබඳවයි.**

1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 වගන්තිය අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයකින් අතෘප්තිමත් වන නිලධාරියෙකුට ඊට එරෙහිව අභියාචනා කිරීම සඳහා වන අභියාචනා බලධාරීත්වය 2002 හා අංක 04 කරන පනතින් පිහිටුවන ලද පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය සතු වේ.
එසේ වුව ද, යම් උසස්වීමක්/ තනතුරට පත් කිරීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගැනීමෙන් පසුව හා තීරණය ගැනීමට පෙර ද නිලධාරීන් විසින් සෘජුවම හෝ ප්‍රගමන පිටපත් ලෙසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන විශාල අභියාචනයන් ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙනු ලැබේ.

2)

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යම් උසස්වීමකට/ තනතුරට පත් කිරීමකට අදාළව ලබා දුන් තීරණයක යම් තාක්ෂණික දෝෂ සිදු වී ඇති ද යන්න හෝ එම තීරණය ගනු ලබන අවස්ථාවේ දී නීති හා රෙගුලාසි පිළිබඳව යාවත්කාලීන දැනුවත් භාවයකින් තොරව ලබා දෙන ලද නියෝගයක් (Per Incuriam Order) ද යන්න සලකා බැලීම සඳහා යම් නිලධාරියෙකු හෝ විශ්‍රාමික නිලධාරියෙකු විසින් යොමු කරනු ලබන <u>පළමු අභියාචනය</u> පමණක් සලකා බැලීමට

II. පහත ආකාරයේ අභියාචනයන් සඳහා නිරීක්ෂණ/ නිර්දේශ අදාළ අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමකින් තොරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිමත් අනුමැතියක් ලබාගෙන ප්‍රතික්ෂේප කිරීමට

a) ඉහත අනු අංක I හි පරිදි පළමු අභියාචනය සලකා බලා තාක්ෂණික දෝෂයක් නොමැති බවට ප්‍රතික්ෂේපිත කාරණයකට අදාළව පළමු අභියාචනයෙහි සඳහන් කරුණුවලට අමතරව වෙනත් කරුණු දක්වා නොමැතිව පළමු අභියාචනයෙන් පසුව නැවත නැවතත් යොමු කරනු ලබන අභියාචනා
b) මීට පෙර පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය විසින් හෝ වෙනත් ඉහළ අධිකරණයක් විසින් හෝ ප්‍රතික්ෂේප කර ඇති කරුණකට අදාළ අභියාචනා
c) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද අදාළ නියෝගය ලද දින සිට දින 60 කට පසුව සහ එම ප්‍රමාදය සඳහා පිළිගත හැකි හේතු දක්වා නොමැතිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා
d) අදාළ රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගය ලබා දීමට පෙර ඉදිරිපත් කරනු ලබන අභියාචනා (එවැනි ලිපි/ පෙත්සම් අභියාචනා ලෙස සලකා නොබලන නමුත් එමඟින් හෙළිදරව් කරන කරුණු අදාළ රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය ලබා දීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.)

III. තව ද කිසියම් අභියාචනයක් ඉහත 2. II හි දක්වා ඇති යම් කාණ්ඩයකට අයත් වේ ද යන්න පිළිබඳව සැක සහිත අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව